දිනමිණ



● ජනාධිපතිවරණයෙන් ජනාධිපතිතුමා ලබාගත් අති විශිෂ්ට ජයග්‍රහණය, රටේ ඉදිරි සංවර්ධන වැඩපිළිවෙළ, ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම, සහ අධිකරණවල නඩු ගොඩ ගැසීම ඇතුළු තවත් කාලීන දේශපාලන සිදුවීම් රැසක් පිළිබඳ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවකි.

● මම ජනතාව අතරට යන්නේ පෝස්ටර්වලින් නෙවෙයි වැඩ කරලයි

සියලු ජන කොටස් එකමුතු කළේ ජනාධිපතිතුමායි

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ අමාත්‍ය මිලින්ද මොරගොඩ

● වසර තිහක යුද්ධය නිමාවුණා. ජනාධිපතිතුමා පැහැදිලි ජනවරමක් ලබා ගත්තා. ඒ පිළිබඳ ඔබේ අදහස

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ලබා ගත්තේ සුවිශේෂී වූ අති විශිෂ්ට ජයග්‍රහණයක්. එතුමාගේ සැබෑ නායකත්වය රටේ නායකයා සේනාධිනායකයා වශයෙන් ත්‍රිවිධ හමුදාව මෙහෙයවා යුද්ධය නිමා කළා. අපේ ඉතිහාසයේ අතීතයේ සිටි රජවරුත් මෙවැනි ජයග්‍රහණ ලබා ගත්තා. මෑත කාලයේ බිහි වූ විශිෂ්ටතම නායකයකු වශයෙන් ජනාධිපතිතුමා සිදු කළ ඒ අතීත ක්‍රියාව හඳුන්වන්න පුළුවනි. ඕනෑම රටක නායකත්වය නිවැරැදි නම් ඒ රටේ නායකයා පිටුපස වන ඒ අණ පිළිපදින කොටස් ද නිවැරැදි වෙනවා. දශක තුනක කාලයක් පුරා පැවැති ත්‍රස්තවාදී උවදුර මේ ආකාරයෙන් නිමා කර රටට සාමය උදා කරන්න හැකි වුණේ ජනාධිපතිවරයා තුළ වූ සුවිශේෂී නායකත්වය නිසයි.

● විධායක ජනාධිපතිධුරය මේ රටට නොගැළපෙනවා හෝ එම ධුරය අහෝසි කළ යුතු යැයි ඔබ අදහස් කරනවාද ?

විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමේ අදහස්වලට මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි. නමුත් එහි යම් යම් කොටස් තිබෙනවා. සංශෝධනය කළ යුතු තත්ත්වයේ ඒවා. ඒවා සංශෝධනය කළ යුතු වෙනවා. විධායක ජනාධිපතිධුරයට අයත් බලතල සම්බන්ධ කොටස් සකස් කෙරුණේ මීට වසර ගණනාවකට පෙර ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාගේ කාලය තුළයි. එදා තිබූ සමාජ තත්ත්වය හා අද තත්ත්වය වෙනස්. එම නිසා විධායක ජනාධිපතිධුරයට හිමි යම් බලතලවලට අදාළ වගන්ති යළි සංශෝධනය විය යුතුව තිබෙනවා.

කෙසේ වෙතත් මේ රටට ගැළපෙන තනතුරක් වෙන්නේ විධායක ජනාධිපතිධුරයයි. එම නිසා එම ධුරය අහෝසි කළ යුතු නැහැ.

● යුද්ධය ජයගත් ජනාධිපතිතුමා රට සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කෙබඳුද ?

යුද්ධය අවසන්. රටේ ආරක්ෂාව තහවුරු වී තිබෙනවා. ජනාධිපතිවරයා අතගසා තිබෙන්නේ විශාල සංවර්ධන ක්‍රියාවලියකටයි. උතුරු නැගෙනහිර ඇතුළුව රට පුරා ආරම්භ කර ඇති එම වැඩපිළිවෙළ තුළින් මේ රටට විශාල සංවර්ධන යුගයක් උදාවී රටේ ජනතාවගේ අවශ්‍යතා සපුරාලමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළම මට්ටමකට ගෙන එන බව පැහැදිලියි. එතුමා වැනි නායකයකුට හැර මෙවැනි සංවර්ධන ක්‍රියාවලියකට වෙනත් කිසිවකුටත් අත ගැසීම අපහසුයි. මේ සඳහා මනා කළමනාකරණයක් තිබිය යුතුයි. ජනාධිපතිතුමා සතුව ඒ හැකියාව තිබෙනවා.

● මෙරට පවතින මැතිවරණ ක්‍රමය පිළිබඳ ඔබ දරන අදහස ?

මේ මැතිවරණ ක්‍රමයේ බොහෝ අඩු පාඩු තිබෙනවා. විශේෂයෙන් මනාප ක්‍රමය. එවැනි සංශෝධනය විය යුතු කොටස් මැතිවරණ ක්‍රමයට අදාළ ව්‍යවස්ථාවල තිබෙනවා. අප රටේ ඇති ඡන්ද ක්‍රමය විදේශ රටවල් කිහිපයක තිබෙනවා. එහෙත් ඒ රටවල ඒවා ක්‍රියාත්මක වීමේදී මීට වඩා සුවිශේෂ වැදගත් ආකාරයකට ක්‍රියාත්මක වෙනවා. මෙරට දේශපාලනයට යන වැඩි පිරිසක් උත්සාහ කරන්නේ ඉතාමත් ඉක්මණින් ඉහළට යාමටයි. දේශපාලනය කිරීමේ යම් කිසි පිළිවෙළක් තිබෙනවා. මෙරට පදිංචිව සිටි ලක්ෂ 20 ක පමණ ජනතාවක් විදේශගතව සිටිනවා. ඔවුන්ට ද ඡන්ද අයිතිය ලබාදිය යුතු යැයි මා සිතනවා. ඒ සඳහා යම් කිසි වැඩපිළිවෙළක් සකස් වෙනවා නම් එය වැදගත්.

● විධායක ජනාධිපතිධුරය අහෝසි කළ යුතු නැහැ

● රටේ ඉදිරි ආරක්ෂක තත්වය ගැන ඔබ යමක් කියනවා නම් ?

මේ රටේ වසර ගණනාවක් ආරක්ෂාව පැහැදිලි තත්ත්වයක නොතිබූ බව සැම කෙනකුම දන්නා දෙයක්. ඈත කාලයේ සිටම අපට දක්නට ලැබුණ පැහැදිලි දෙයක් තමයි රටේ විවිධ ජාතීන් අතර වූ අසමගිතාවය. එම අසමගිතාව නැති කර සෑම ජන කොටසක්ම එකට එකතු කළ එකම නායකයා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බවට විවාදයකින් තොරව පිළිගත හැකියි. යුද්ධය නිම කර ජනතා කොටස් අතර සමගිය ඇතිවූ ප්‍රථම අවස්ථාව මෙයයි.

රටක විවිධ ජන කොටස් අතර පවතින සමගිය මේ රටේ ජනතාවට බෙහෙවින් බලපානවා. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රථමයෙන්ම කළේ රටේ ජන කොටස් අතර සමගිය ඇති කිරීමයි. ඒ සමගිය ඇති කිරීමත් සමගම එතුමා විදේශ ගතව සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාවට විවෘතවම ආරාධනාවක් කළා රට ආරක්ෂිතයි, රටේ ජනතාව සමගියි, දැන් පැමිණ මේ රටේ පදිංචි වෙන්න කියලා. ඇත්ත වශයෙන්ම එතුමාගේ නායකත්වයේ දක්නට ලැබුණ තවත් සුවිශේෂී ලක්ෂණයක් එය. යුද්ධය නිසා රට හැර ගිය පිරිසට යළි පැමිණෙන්නැයි ආරාධනා කිරීමේ යුතුකම ජනාධිපතිවරයා ඉතා ඉහළින් ඉෂ්ට කළා. රටට ජනතාවට ආදරය කරන නායකයකු සතු උතුම් ගුණාංගයක් ලෙස එම ගති ලක්ෂණ අපට දක්නට හැකියි.

එතුමාගේ ඒ නායකත්වය අද ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක ප්‍රචලිත වී තිබෙනවා. ජාත්‍යන්තර රටවල් විශාල ප්‍රමාණයක් මෙරටට උදව් උපකාර කිරීමට ඉදිරිපත් වී සිටින්නේ ජනාධිපතිවරයාගේ එම දක්ෂතාව නිසයි.





● නැවත මෙරට තුළ කොටි ත්‍රස්තවාදී ප්‍රශ්නය ඇති නොවේ යැයි ඔබ සිතනවාද ?

ජනාධිපතිවරයා ත්‍රස්තවාදය නිමා කිරීමත් සමග අවධානය යොමු කළේ රටේ ආරක්ෂාව සහ දියුණුව සම්බන්ධවයි. අත් අඩංගුවට ගත් සහ බාර වූ ත්‍රස්තවාදීන් විශේෂයෙන් ළමා වයසේ සිටින පිරිස තෝරාගෙන අධ්‍යාපන කටයුතුවලට යොමු කළා. මට අධිකරණ ඇමැති වශයෙන් එම කටයුතුවලදී විශේෂ වගකීමක් පැවරී තිබෙනවා. පුනරුත්ථාපන කටයුතු මෙහෙයවීම සිදු කෙරෙන්නේ අධිකරණ අමාත්‍යාංශය යටතේ. දැනට අධ්‍යාපන කටයුතුවලට යොමුකළ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු ඉතාමත් හොඳින් සිදු කෙරෙන අතර සෙසු පුනරුත්ථාපන කටයුතුවලට යොමු කළ පිරිස්වලටද නැවතත් ත්‍රස්තවාදයට යොමු නොවන ආකාරයේ මානසික තත්ත්වය සකස් කෙරෙන ඉහළම පුනරුත්ථාපන වැඩපිළිවෙළක් සිදු කෙරෙනවා. තවත් ටික කාලයක් තුළ ඔවුන්ගේ පුනරුත්ථාපන කටයුතු අවසන් වීමෙන් පසු ඔවුන්ගේ හැකියාවන් අනුව ඒ ඒ අංශවලට යොමු කර රැකියා අවස්ථා ලබාදීමට කටයුතු කෙරෙනවා. ඒ අතර ඔවුන් පිළිබඳව නිරතුරුවම අධීක්ෂණය කරන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බවද මෙහිදී සඳහන් කළ යුතුයි.

● යහපත් ජීවිතයක් ගත කිරීමේ කැමැත්ත ඇති පිරිස් පුනරුත්ථාපනය වන ත්‍රස්තවාදී සාමාජිකයන් අතර සිටිනවාද ?

එම තරුණයන් කාලයක් ගමන් කර තිබුණේ වැරැදි ගමන් මාර්ගයක් තුළයි. නමුත් දැන් ඔවුන්ට නිවැරැදි ගමන් මග කුමක් දැයි අවබෝධ වී සිටිනවා. සෑම තරුණයකු පාහේම උත්සාහ කරන්නේ යහපත් ගමනක් යාමටයි. ඔවුන්ට ඒ ගමන යාමට අවශ්‍ය ගමන් මග කුමක්දැයි රජය හඳුන්වා දී තිබෙනවා. මම සිතනවා ඔවුන් ඒ මග ගොස් ජීවිත ජයග්‍රහණය ලබා ගනීවි කියලා.

● මෙරටට එල්ලවන ජාත්‍යන්තර කුමන්ත්‍රණ ගැන ඔබ දකින්නේ කෙසේද ?

මෙරට විවිධ කොටස් විදේශ ගත වී සිටිනවා. ඒ කොටස්වල සහයෝගය නොමැතිව මෙරටට එරෙහි කුමන්ත්‍රණ කිරීමට විදේශිකයන්ට හැකියාවක් නැහැ. මෙරට ත්‍රස්තවාදී කලබල ආරම්භ වූ අවදියේදී එනම් මීට වසර ගණනාවකට පෙර විදේශ ගත වූ පිරිස් සිටිනවා. ඔවුන් මේ රටේ තත්ත්වය හරියට දැක නැහැ. යුද්ධය අවසන් වීම තුළින් රට තුළ සිදුවී ඇති වෙනස ඔවුන් දැක නැහැ. එවැනි කරුණු හරි හැටි නොදන්නා නිසා ඔවුන් කුමන්ත්‍රණවලට හසුවෙනවා. කෙසේ වෙතත් ජාත්‍යන්තර වශයෙන් එල්ල වන කුමන්ත්‍රණ ගැන නොසිතා රටේ ඉදිරි කටයුතු ගැන සිතා ඒ පිළිබඳව කාලය යෙදවීම වැදගත් යැයි මා සිතනවා.

● ජෙනරාල් ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම සම්බන්ධව ඔබ දරන අදහස කුමක්ද ?

එය නීතිමය ප්‍රශ්නයක්. ඒ නිසා රටේ නීතියට අනුව එම කරුණු සම්බන්ධව සිදු වන දේවල් ගැන කතා කිරීම අනවශ්‍ය දෙයක් ලෙසයි මා දකින්නේ.

● අද මේ රටේ අධිකරණවල නඩු ගොඩ ගැසීම මේ නිසා විශාල තදබදයක් ඇති වී තිබෙනවා. අමාත්‍යාංශයෙන් ඊට ලබා දෙන විසඳුම කුමක්ද ?

මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. දිවයිනේ සෑම ප්‍රදේශයකම මේ අධිකරණ තදබදය අධික ලෙස තිබෙනවා. ඒ වගේම සිරගෙවල් වල මේ සඳහා අවශ්‍ය විසඳුම් සඳහා යෙදිය යුතු සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. දිවයින පුරා උසාවි අලුතින් පිහිටුවීම සිදු කෙරෙන අතර නඩු කල්ගත වීම වැළැක්වීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග තුළ වෙනත් වැඩපිළිවෙළක් අනුගමනය කිරීමට මේ වන විටත් පියවර ගෙන තිබෙනවා. කෙසේ වුවත් මෙමම නඩු කල්යාම වළක්වා ඉතාමත් කඩිනමින් නඩු විභාග අවසන් කිරීමේ වැඩපිළිවෙළක් සැලසුම් කර තිබෙනවා. ඒ මගින් එම නඩු ගොඩගැසීමේ තදබදය ලිහිල් කර ගැනීමට හැකි වන බව සඳහන් කළ හැකියි.

● ඔබ මහා මැතිවරණයට ඉදිරිපත් වෙන්නේ බැනර් කටවුට් පෝස්ටර් වැනි ප්‍රචාරක කටයුතුවලින් තොරවයි ?

ඔව් මම මහජනතාව අතරට යන්නේ ඔවුන් වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කිරීමෙන් අනතුරුවයි. මට පැවරුන වගකීම මා ඔවුන් වෙනුවෙන් ඉෂ්ට කරනවා නම් මා කවුද යන්න අමුතුවෙන් හඳුන්වාදීමට අවශ්‍ය නැහැ. ඒ අනුව මම මේ වන විට මගෙන් සේවයක් ඉෂ්ට විය යුතු සෑම ජන කොටසකගේම අවශ්‍යතා වගකීම් ඉටු කර දී තිබෙනවා. ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දී තිබෙනවා. මට ලැබී ඇති අමාත්‍යාංශ කටයුතු පැහැර හැර නැහැ. ඒ අනුව මට ඡන්දය අමුතුවෙන් ලබා දෙන්න කියා` මා කවුද යන්න ඔවුන්ට හඳුන්වා දිය යුතු වෙන්නේ නැහැ. අති විශාල මුදල් සම්භාරයක් වියදම් කර බැනර් කටවුට් යෙදීමට යන මුදල් සියල්ලම මේ වන විට සමාජ සුබ සාධන කටයුතුවලට යොදමින් තිබෙනවා.

සාකච්ඡා සටහන
විජයානි එදිරිසිංහ
ඡායාරූප
රංජිත් ජයවීර